පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලිය - 2023

කලාප මට්ටමේ තරග

ශ්‍රේණිය 11

කලාපය : ........................................
පාසල : ........................................
පාසල් කාණ්ඩය : 200 ට අඩු /201-500 / 501 ට වැඩි
අයදුම්කරුගේ නම : ........................................

කාලය : පැය 2

## අත් අකුරු හා භාෂාවේ ශිල්පීය ක්‍රම

01 . (අ) පහත සඳහන් පදවල ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

උදාහරණ - සමාජය - ස් + අ + ම් + ආ + ජ් + අ + ය් + අ

| | |
|---|---|
| i.ගද්‍ය | ii.කමත |
| iii.විවිධ | iv.කර්තෘ |
| v.කෘත්‍රිම | vi.අශෝභ |
| vii.විසර්ගය | viii.ගෞරවය |
| ix.වෛද්‍ය | x. කුඹුර |

(ලකුණු 10 )

(ආ) පහත දැක්වෙන ස්වර ව්‍යඤ්ජන එක්වීමෙන් සෑදෙන අක්ෂරය තිත් ඉර මත ලියා එම අකුර සහිත වචනයක් ඉදිරියෙන් ලියන්න.
උදාහරණ - ක් + ඍ + කෘ - කෘත්‍රිම

| | |
|---|---|
| i. බ්+ර්+ඇ ...................... | ii. වි+ය්+ආ ............................ |
| iii. බ්+ර්+ඉ ......................... | iv. ග්+ඖ ............................... |
| v. ධ්+ය්+ආ ........................ | vi. ජ්+ර්+අ ............................. |
| vii. න්+ය්+ආ ....................... | viii. ක්+ඓ ............................... |
| ix. ච්+ර්+අ .......................... | x. ද්+වි+ඉ ............................... |

(ලකුණු 10 )

02. (අ) පහත සඳහන් අක්ෂර වගුවෙහි අදාළ ස්ථානවල ලියන්න.

උ එ ඉ ණ ම ද හ ළ ග අ

| ආරෝහණ අක්ෂර | අවරෝහණ අක්ෂර | මධ්‍ය අක්ෂර |
|---|---|---|
| | | |

(ලකුණු05 )

(ආ) පහත දැක්වෙන වචනවල අග අකුරු දෙක මුලට යොදාගෙන අකුරු තුනක් හෝ ඊට වැඩිම හෝ යෙදෙන අර්ථවත් වචනයක් බැගින් ලියන්න.

| | |
|---|---|
| i. උතුම් | ii. ගෞරවය |
| iii. නමින් | iv. ප්‍රස්තාව |
| v. මුවට | vi. අවසරය |
| vii. සුකුමාරකම | viii. නිදසුන් |
| ix. තාර්කික | x. වාලුකාංගණ |

(ලකුණු 10 )

03. (අ) පහත සඳහන් පදවල තද කළු අකුරින් මුද්‍රිත අක්ෂරයේ ඇති පිල්ලම් නම් කර එම පිල්ලම් ඇතුළත් වෙනත් පදයක් ලියන්න.

| | |
|---|---|
| i. **ධූ**ම කේතුව | ii. පරි**ශී**ලනය |
| iii. **දෛ**නික | iv. පො**ළො**ව |
| v. මි**ශ්‍ර**ණය | vi. වයෝ**වෘ**ද්ධ |
| vii. ම**ද්‍ය**සාර | viii. **පෞ**රාණික |
| ix. ම**නෝ**ඥ | x. **රූ**ධිරය |

(ලකුණු 10 )

(ආ) පහත දැක්වෙන පදවල අක්ෂර වින්‍යාසය නිරවද්‍ය කොට ලියන්න.

| | |
|---|---|
| i.අධ්‍යාපනික | ii.පරිඝණකය |
| iii.එලිසමය | iv. දෘඝ්‍යමාන |
| v.අයිතිහාසික | vi.කැළණිය |
| vii.උද්දච්ච | viii.ත්‍රසජනක |
| ix.ඇබැර්තුව | x.කාලගුනය |

(ලකුණු 05යි )

04. (අ) පහත දැක්වෙන වචන පැහැදිලි අකුරෙන් නැවත ලියන්න. අක්ෂර වින්‍යාසය වැරදි නම් නිවැරදි කරන්න.

| | |
|---|---|
| i.උපකරන | ii.පුලුන්ගොඩ |
| iii.කණගාටුව | iv.පිළිවෙල |
| v.ඔරලෝසුව | vi.සමනොළකන්ද |

vii.කෝච්චිය viii.ස්වභාවික

ix.ගණකරාමු x.මුහුන

(ලකුණු 05යි )

(ආ) පහත දැක්වෙන පදවල ප්‍රත්‍යය හා ප්‍රකෘති වෙන් කොට ලියන්න.

i.පහන ii.කන්ද

iii.දැරිය iv.මහල්ලෝ

v.අත්තෙන් vi.යතුර

vii.සිංහයා viii.ගිරවු

ix.ග්‍රන්ථය x.යහපත

(ලකුණු 10 )

05. (අ) පහත දැක්වෙන පද යුගලයේ එක් පදයක් අනෙක් පදය හා කිසියම් අයුරකින් නොගැළපේ. එක් පදයක් පමණක් වෙනස් කර ගළපා ලියන්න.

i.විශේෂ දෙසුම ii.මිනිස් ශරීරය

iii.කර්තෘ වැකි iv.ශුභ පැතුම්

v.පාසල් ශිෂ්‍යයා vi.කිතු ඝෝෂාව

vii.විදෙස් ප්‍රවෘත්ති viii.පස් වගීය

ix.අඳුන් පර්වතය x.දීර්ඝ කල්

(ලකුණු 10 )

(ආ) පහත සඳහන් අවස්ථාවලට වඩාත් සුදුසු විරාම ලක්ෂණය ඉදිරියේ ඇති තිත් ඉර මත යොදා එය නම් කරන්න.

i. වචන කෙටි කර දැක්වීමේ දී යෙදේ. ................................
ii. නියෝගයන්හි දී යෙදේ. ................................
iii. යම් ප්‍රකාශයක් වැඩිදුරටත් පැහැදිලි කිරීමේදී යෙදේ ..............................

iv. පාඨයකින් මඟ හැරුණු අකුරක් පදයක් පද සමූහයක් නැවත ලියාදැක්වීමේදී යෙදේ. .................................

v. යමක් විශේෂ කොට දැක්වීමට අවශ්‍ය අවස්ථාවල දී යෙදේ .................................

(ලකුණු 05 )

## II කොටස

- පහත දැක්වෙන ඡේදය කියවා අක්ෂර වින්‍යාසය සදොස් තැන් ඇතොත් නිදොස් කොට සම්මත ආකාරයට පද බෙදා සුදුසු තැන්වල විරාම ලකුණු යොදා ,අක්ෂරවල නිවැරදි හැඩය හා පිරිපුන් බව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් වාර 10ක් ලියන්න.

දැන්ටිකදවසකඉදලාමටපොඩිවැඩක්කරන්නකියලාහිතලතියෙනවාසිරිමාන්නමහත්
තයමමමේගැනසිරිමාන්නමහත්තයාඑක්කලකතාකරන්නකියලමයිහිතාගෙනහිට
යෙඑමොකක්දඅබිලින්උන්නැහේදැන්බලන්නඅපිපන්සලටමල්ටිකක්පූජාකරන්න
ගියාමමල්ටිකදොහොතකරන්නයිඅත්දොහොනකරගන්නයිතියෙනකරදරේපැන්ටික
ගේන්නතියෙන්නේපරණමැටිකොතලකබලක්මල්පූජාකරන්නඑනමනුස්සයොඔයමැ
ටිකොතලකබලඅරගෙනකීසැරයක්නම්ළිදළඟටයනවදපැන්ටිකගේන්නඅබිලින්උන්
නැහේගේඒකතාවනමඇත්තතමයිඔන්නඔයහින්දමමමකල්පනාකළාවිහාරෙළඟින්
වතුරමලක්හදන්නදැනටමත්පන්සලටනම්පයිප්පහයිකරලාතියෙනහින්දඔයවැඩේක
රන්නඒතරම්අමාරුවෙනඑකක්නැහැ

(ලකුණු 20 )